# කුඩා රබර් ගොවි සංවිධාන පිහිටුවීම

ඩී. ඩී. දසනායක*

දිවයින පුරා රබර් වැවෙන දිස්ත්‍රික්ක වන කලුතර, රත්නපුර, කෑගල්ල, කොළඹ, ගම්පහ මොණරාගල, මහනුවර, මාතලේ සහ කුරුණෑගල වැනි දිස්ත්‍රික්කවල රබර් වැවීම සහ නිෂ්පාදනයෙහි හුදකලාව කටයුතු කරන කුඩා රබර් වතු හිමියන් 1,65,000 ක් පමණ පිරිසක් සිටිති. මෙම පිරිස සතුව අක්කර 65,000 ක් පමණ ඇත. මොවුන් තම ප්‍රදේශයෙහි වෙසෙන රබර් මිළදී ගන්නා වෙළෙන්දන් මෙන්ම රබර් කිරි මිළදී ගන්නා ආයතන කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වන දිළිඳු භාවයෙහි දුෂ්කර චක්‍රයට හසු වී තම ජීවන සංවර්ධනය සොයන පිරිසක් බව පෙනී යයි. මෙම පිරිස එම දුෂ්කර චක්‍රයෙන් මුදවාගෙන සාමූහික ඒකරාශිකරණයකට පෙළඹවීම මගින් ඇති කර ගන්නා වූ නීතිමය රාමුවක් යටතේ වූ ආයතනික රටාවකට හසු කරවීමේ ක්‍රියාවලියක් ලෙසින් ගොවි සංවිධාන ඇති කරවීමේ වැඩ පිළිවෙල හඳුන්වා දිය හැක.

## ගොවි සංවිධාන ව්‍යාපාරයේ අරමුණු

මෙම සංවර්ධන ක්‍රියාදාමයෙහි ගොවි සංවිධාන විසින් ක්‍රියාත්මක කරවීමට හැකි වන සේවාවන් අතර පහත දැක්වෙන අරමුණු හඳුනා ගැනීමට හැකිවනු ඇත.

1. නිලධාරී මෙහෙයවීමකින් නිදහස්ව ගොවි ප්‍රශ්න තමන් විසින්ම සාම්ප්‍රදායික ක්‍රම වලින් බැහැරව විසඳා ගැනීමට හැකිවන සේ ගොවියාට දැනුම ලබාදීම සහ එමගින් ඔවුන්ට සාමූහිකව නෛතික බලයක් ලැබෙන පරිදි ක්‍රියා කරවීම.
2. එකා සැමටත් සැම එකාටත් යන සංකල්පය ප්‍රායෝගික කරවීම.
3. මූල්‍යමය කරුණු කෙරෙහි ගොවි හැසිරවීම අර්ථවත් කරවීම.
4. ගොවි නිෂ්පාදනවල ගුණාත්මක බව වර්ධනය කරවීම.
5. අලෙවි උපාය මාර්ග සොයා බලා ඒ අනුව අලෙවි කටයුතු මෙහෙයවීම.
6. රබර් ක්ෂෙත්‍රයට අදළ රාජ්‍ය සේවාවන් මෙම සංවිධාන තුළින් ගොවියා අතරට යැවීමේ මාර්ග ඇති කරවීම.
7. කාන්තා සහභාගීත්වය ඇතිකරවීම.

## වත්මන් ක්‍රියාකාරිත්වය

රබර් ගොවි මෙන්ම රබර් නිෂ්පාදන සංවිධාන පහත දැක්වෙන වගුව යටතේ ඒ ඒ දිස්ත්‍රික්ක පුරා පිහිටුවා ඇත. මෙම සංවිධාන ක්‍රියාකාරී භාවයෙහි විවිධ මට්ටම්වල ඇත. ඇතැම් සංවිධාන සාමූහික රබර් අලෙවිය, ගොවීන්ට ණය පහසුකම් සැපයීම සහ වගා යෙදවුම් ද්‍රව්‍ය සැපයීම වැනි ක්‍රියාකාරකම් වල නියුක්තව සිටිති.

* දිසා උපදේශක නිළධාරී, කෑගල්ල.

| දිස්ත්‍රික්කය | සමිති සංඛ්‍යාව | ක්‍රියාකාරි සමිති සංඛ්‍යාව |
|---|---|---|
| කෑගල්ල | 81 | 35 ක් පමණ |
| රත්නපුර | 24 | 20 ක් පමණ |
| මොණරාගල | 04 | 02 ක් පමණ |
| කලුතර | 60 | 28 - 35 ක් පමණ |
| ගාල්ල | 17 | 05 – 07 ක් පමණ |
| කොළඹ | 25 | 12 ක් පමණ |

## ගොවි සංවිධාන ඇති කරවීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය

දිවයින පුරා ඇති ක්ෂෙත්‍ර නිළධාරි කොට්ඨාශ වල දනට බිහි කර තිබෙන ගොවි සංවිධාන වල නියෝජිතයින් සඳහා දින දෙකහමාරක ''නායකත්ව පුහුණු වැඩ සටහන'' මැයින් නේවාසික පුහුණු පාඨමාලාවක් මතුගම නිවිතිගලකැලේ පිහිටි ආයතනික පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙහිදී ගොවි නායකයින් සතුව තිබිය යුතු ගුණාංග වර්ධනය කරවීම සහ ආරෝපණය කරවීම වැඩ සටහනෙහි තේමාව විය. පාඨමාලාව මගින් මෙම ගොවීන් වෙත සමාජ විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක, තාක්‍ෂණය පිළිබඳ සංනිවේදනය අලෙවි කටයුතු වලදී ගිණුම් කරණය සහ සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන වැනි නිෂ්පාදනය ආයතනවල පරිපාලනය වැනි අත්‍යවශ්‍ය යැයි හැඟෙන විෂයයන් පිළිබඳව වූ අධ්‍යයනයන් කෙරෙහි ඔවුන් යොමු කරවන ලදී. ක්ෂෙත්‍ර නිළධාරීන් මෙම විෂයයන් යටතේ පුහුණු කරවන ලදී. දනට දිවයින පුරා සිටින සියලුම ක්ෂෙත්‍ර නිලධාරීන් මෙම ගොවි සංවිධාන ක්‍රියාත්මක කරවීමෙහි කාර්යක්‍ෂමව නියුක්තවී සිටිති.

## ගොවි සංවිධාන අතර අන්තර්ක්‍රියාකාරීත්වය

පහත දක්වෙන සටහනේ අන්දමට පිළිවෙලින් ක්ෂෙත්‍ර නිළධාරි කොට්ඨාශ, ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමේ කමිටු මෙම ගොවි සංවිධාන නියෝජනය වන පරිදි බිහි කිරීමට පියවර ගෙන යමින් පවතී.

| දෙපාර්තමේන්තු කලාපීය සැකැස්ම | සමාන්තර ගොවිසංවිධාන කමිටු සැකැස්ම |
|---|---|
| ක්ෂෙත්‍ර නිලධාරි මට්ටම | කොට්ඨාශ කමිටුව (ගොවි සංවිධාන නියෝජිතයින්ගේ) |
| ප්‍රාදේශීය නිළධාරි මට්ටම | ප්‍රාදේශීය කමිටුව(ක්ෂෙත්‍ර නිල:කොට්ඨාශ නියෝජිතයින්ගේ) |
| දිස්ත්‍රික් මට්ටම | දිස්ත්‍රික් කමිටුව (ප්‍රාදේශීය ගොවි නියෝජිතයින්ගෙන්) |
| අධ්‍යක්‍ෂ නියෝජන මට්ටම | සමස්ත ලංකා කමිටුව (දිස්ත්‍රික් නියෝජිතයින්ගෙන්) |

## ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා

1. ඒකරාශීකරණයෙන් ලැබෙන නෛතික තත්ත්වයෙහි වැදගත්කම පිළිබඳව ගොවීන් සතුව තිබෙන අල්ප දැනීම.
2. ගොවීන් ඒකරාශිකරණය කෙරෙහි පෙළඹවීම පිළිබඳව ඇති උපාය මාර්ගවල සීමාකාරී බව.
3. සංවිධාන ලියාපදිංචි කිරීමේ දී සළකනු ලබන සාධකවල අවශ්‍යතා මට්ටම කරා ළඟාවීමේ දුර්වලකම් සහ අක්‍රමවත් බව.

4. ගොවි සංවිධාන අරමුදල් ගොඩ නගා ගැනීම කෙරෙහි පැහැදිලි අවබෝධයක් ගොවීන් තුළ නොමැතිවීම.

5. සංවිධාන ක්‍රියාකාරකම් කෙරෙහි රජයේ විශේෂ අනුග්‍රහශීලී අවධානයේ ඌනතාවයත්

ඉහතින් දක්වා ඇති කරුණු ගොවි සංවිධාන ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී ප්‍රායෝගිකව හඳුනාගැනීමට ලැබුණු සම්බාධක වන අතර මේවාට පිළියම් යෙදීමෙන් ගොවි සංවිධාන වැඩ පිළිවෙල සාර්ථක කරගැනීමට හැකිවනු ඇත. ගොවීන්ට හොඳින් අවබෝධ වන පරිදි සංවිධාන වැඩපිළිවෙලෙහි අගය නිළධාරීන් විසින් ක්‍රමිකව අර්ථවත් කළ යුතුව ඇත.

## සමිති කාර්යක්ෂම කිරීමේ යෝජනා

1. හැකි සෑම ගොවි සංවිධානයකටම රබර් මිළදී ගැනීම සඳහා වෙළෙඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් මිළදී ගැනීමේ ආයතනවල මිළදී ගැනීමේ ක්‍රම හඳුන්වාදීම.

2. අරමුදල් සංවර්ධනය කිරීම.

3. කිරිකැපීම අර්ධකාලීන රැකියාවක්වන හෙයින් අර්ධ දෛනික ශ්‍රමය පූර්ණකාලීන කරවීම සඳහා ගෘහ කර්මාන්ත වැනි ස්වයං රැකියා වල රබර් ගොවීන් නියුක්ත කරවීමට පියවර ගැනීම.

4. එදිනෙද අවශ්‍ය වන සිල්ලර ආහාර ද්‍රව්‍ය අදළ සමුපකාර ප්‍රාදේශික මගින් සමිතිවල ගොවි සාමාජිකයින්ට ලබාදීමට (ණය පදනමක් යටතේ) කටයුතු කිරීම.

5. වගාවට සහ නිෂ්පාදනයට අවශ්‍යවන යෙදවුම් ද්‍රව්‍යයද අදළ සමුපකාර ප්‍රාදේශික මගින් ණය පදනමක් යටතේ සමිතිවල ගොවි සාමාජිකයින්ට ලබාදීමට කටයුතු කිරීම.

6. නිලධාරීන් අදළ විෂයයන් කෙරෙහි දැනුවත් කිරීම සහ ඔවුන් වෙත දිරි ගැන්වීමේ ක්‍රම හඳුන්වාදීම.

### සාරාංශය

ගොවි සංවිධාන වැඩ පිළිවෙල ව්‍යාප්ති සේවයෙහි කාර්යක්ෂමතාවය වර්ධනය කරවීමට මෙන්ම ගොවීන්ට අවශ්‍ය වන තාක්ෂණය ලබා ගැනීමෙහි උපාය මාර්ග පහසුවෙන් ඔවුන්ටම සළසා ගැනීමට හැකිවනු ඇත. එමගින් ගොවි ජන ජීවිතයෙහි ආර්ථික සංවර්ධනයට ඇවැසි එලදයි වගාක්‍රම, නිෂ්පාදන ක්‍රම, අලෙවි ක්‍රම, සඳහා ගොවීන්ට පහසුවෙන් යොමුවීමේ උපක්‍රම සොයා ගැනීමට හැකිවීම සහ මෙම පදනම මත ගොවීන් සැමටම තම ශක්තිය තුළින් නෛතික බලයක් තමන් වෙත ආරෝපනය කර ගැනීමටද හැකිවනු ඇත.